විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය - 2014

---------------------------------------------------------------------

විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ (HETC) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2010 අගෝස්තු 26 දින එළඹි අංක 4686 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 ආ (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සමාන සමාජයීය හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා අරමුණු කරගත් ගුණාත්මක උසස් අධ්‍යාපන සේවා බෙදා හැරීම පිණිස ග්‍රාහකයාගේ උසස් අධ්‍යාපන පද්ධතිය, ආයතනයන් හා මානව සම්පත්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම, ඉගැන්වීමේ හා ඉගෙනීමේ අදාළ බව හා ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම, විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය, නියාමනය, ඇගයීම, අධ්‍යයන, සම්බන්ධීකරණය හා සන්නිවේදනය යනාදී වශයෙන් ප්‍රධාන සංරචක හතරකින් ව්‍යාපෘතිය සමන්විත වේ. ණය ගිවිසුමට අනුව එජඩො මිලියන 40 කට සමානවූ රු. මිලියන 4,930 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා

කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඍ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් වන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයනලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර වියදම් වාර්තා කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

2.2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම
--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් රෙගුලාසි අංක756 අනුව ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ට්‍රි අයිතමයන්හි පැවැත්ම තීරණය කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 22 ක් පිරවීමට කටයුතු නොකර 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 හි සඳහන් ප්‍රතිපාදන වලට වඩා වැඩි වැටුප් ප්‍රමාණයන් ගෙවමින් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන තිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂිත පනතේ ප්‍රතිපාදනවලට පටහැනිව ව්‍යාපෘතියේ වර්ෂ 4ක් පමණක් සේවය කර ඉවත්ව ගිය සේවකයින් තිදෙනෙකුට එකතුව රු.911,247 ක පාරිතෝෂිත දීමනා ගෙවා තිබුණි.

(ඈ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 1/2010/01 දරන චක්‍රලේඛයේ 3(iii) ඡේදය අනුව දිනකට එ.ජ.ඩො 30 බැගින් වූ අනියම් දීමනාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේදි විදේශගත වූ පුද්ගලයින් 6 දෙනෙකු වෙනුවෙන් දිනකට එ.ජ.ඩො 50 බැඟින් අනියම් දීමනා ගෙවීම් කර තිබුණි. තවද යථෝක්ත චක්‍රලේඛයේ 6.1 ඡේදයේ සඳහන් ප්‍රතිපාදන ඉක්මවා විදේශගත වූ නිලධාරීන් 13 දෙනෙකුට රු.591,757 ක සංයුක්ත දීමනා ගෙවීම් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත අරමුදල් ප්‍රතිපාදන හා උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ජා.සං.ස | 40 | 4,930.06 | 965 | 8.92 | 964.99 | 22.98 | 2,947.80 |
| | 40 | 4,930.06 | 965 | 8.92 | 964.99 | 22.98 | 2,947.80 |

ඉහත තොරතුරු අනුව ව්‍යාපෘති කාලයෙන් සියයට 80 ක් ගෙවී ගියද ව්‍යාපෘතිය සඳහා වෙන්කළ අරමුදල් වලින් සියයට 60 ක් පමණක් උපයෝජනය කර තිබුණු බැවින් ඉදිරි වර්ෂයක කාලපරිච්ඡේදයක් තුළදී එ.ජ.ඩො. මිලියන 17.02 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳව විගණනයේදී සැකසහිත විය.

3.2 භෞතික ප්‍රගතිය

------------------

උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම ඉගැන්වීමේ හා ඉගෙනීමේ ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම, විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය, නියාමනය, ඇගයීම, අධ්‍යයන, සම්බන්ධීකරණ හා සන්නිවේදනය යනාදී වශයෙන් ප්‍රධාන ක්ෂේත්‍ර හතරකින් ව්‍යාපෘතිය සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද එම කාර්යන්ට අදාල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

(අ) උසස් අධ්‍යාපන අංශය සඳහා ආයතනගත නියමයන් සංරචකය යටතේ ජාතික සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීමට අදාල කාර්යයන් 2012 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දී තිබුණු යාවත්කාලීන කළ රාමුව සඳහා 2014 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නවීකරණ වැඩසටහන යටතේ නායකත්ව හා තත්ත්ව සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු 2015 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කළද 2014 දෙසැම්බර් 31 වන විට කිසිදු ප්‍රගතියක් වාර්තා නොවීය.

(ඇ) ව්‍යාපෘතිය විසින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ප්‍රදාන ලබාදුන් පුද්ගලයින් 221 දෙනෙකුගෙන් 78 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු 2014 දෙසැම්බර් මාසයේ අවසන් කිරීමට අපේක්ෂා කළද 2014 දෙසැම්බර් 31 වන විට 21 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) උසස් අධ්‍යාපනය පිළිබඳ ආර්ථික අදාළත්වය සංවර්ධනය කිරීම සඳහා සියළුම විශ්වවිද්‍යාල වලට ව්‍යාපෘතිය යටතේ ඇති විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන සහාය වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ හතර සඳහා කරන ලද ප්‍රතිපාදන සලකා බැලීමේදී විශ්වවිද්‍යාල 07 ක් විසින් අදාල ආර්ථික ඉලක්ක ඉටුකර ගෙන නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාල වල බාහිර උපාධි වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දින දක්වා වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් විශ්වවිද්‍යාල 8ක් විසින් යොමුගත අරමුණු සඳහා උපයෝජනය කිරීම සියයට 15 සිට සියයට 49 ක පරාසයක පමණක් විහිදී තිබුණි.

3.3 මතභේදයට තුඩු දෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරීවරියක් මෙම ව්‍යාපෘතිය වැඩබලන මූල්‍ය කළමනාකරු හා මූල්‍ය උපදේශක ලෙසද රාජකාරී කර තිබුණු ඇයගේ ස්ථිර තනතුරට අමතරව 2014 වර්ෂයේදී දීමනා ලෙස ව්‍යාපෘතිය විසින් රු. 892,667 ක් ගෙවා තිබුණි. මාසික දීමනාව රු.75,000 බැගින් ගෙවමින් තවත් මූල්‍ය උපදේශකවරයකුද පත්කර තිබුණු අතර ඉහත තනතුරු තුන සඳහාම සමාන රාජකාරී ලැයිස්තු නිකුත් කර තිබුණි.

(ආ) මාසික වැටුප රු.75,000කට නියෝජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරුවෙකු බඳවාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු නමුත් ඒ වෙනුවට මාසික දීමනාව පිළිවෙලින් රු.150,000 හා රු.80.000 බැගින් ප්‍රසම්පාදන උපදේශකවරු දෙදෙනකු ව්‍යාපෘතිය විසින් පත්කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සඳහා 2014 ඔක්තෝබර් සිට රු.110,000ක මාසික වැටුපකට නව ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයකු පත්කර තිබුණු අතර හිටපු අධ්‍යක්ෂවරයා රු.60,000 ක මාසික දීමනාවකට ව්‍යාපෘති උපදේශකයකු ලෙස 2014 ඔක්තෝබර් සිට 2015 මාර්තු දක්වා කටයුතු කර තිබුණි. එසේම නව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට ව්‍යාපෘති කටයුතු අධ්‍යයනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 100,000ක අමතර දීමනාවක්ද ගෙවා තිබුණි.

(ඈ) රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනවල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් 12 දෙනෙකුට එකතුව රු. 3,464,100 ක් ගෙවීම් කර තිබුණු නමුත් එම පැවරුම් ව්‍යාපෘති කාර්යයන්ට අදාල වන බවට විගණනයේදී තහවුරු කර ගැනීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) කුලී පදනම මත යොදවාගෙන තිබුණු වාහන දෙකක් සඳහා එකතුව රු. 1,440,000 ක් වූ කුලී ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි. කෙසේ වුවද අදාල වාහන ව්‍යාපෘතියේ අරමුණු සඳහා යොදාගත් බවට තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ව්‍යාපෘතිය විසින් විශ්වවිද්‍යාලවල හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රජාවගේ ධාරිතා වර්ධනය සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබාදීම වෙන්කරන ලද අරමුදල් වලින් ව්‍යාපෘති නියාමන ඒකකයට කෙටිකාලීනව පත්කරන ලද උපදේශකයින්ගේ විදේශ ගමන් සඳහා රු. 2,859,475 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි.

(උ) 2014 ගෝලීය සංසද සමුළුව සඳහා සහභාගිවීමට නියමිතව සිටි හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ ලියාපදිංචි වීසා සහ ගුවන් ටිකට් ගාස්තු වශයෙන් රු. 432,722 ක් ව්‍යාපෘතිය විසින් දරා තිබුණු නමුත් ලබාදුන් තොරතුරු අනුව මෙම සමුළුව සඳහා අදාල නිලධාරියා සහභාගි වී නොතිබුණි.

### 3.4 අරමුණින් පරිබාහිර ක්‍රියාකාරකම්

-----------------------------------------

ව්‍යාපෘති කාර්යයන්වලට සෘජු සම්බන්ධයක් නැති විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය කටයුතු හා වෙනත් කාර්යයන් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකුට හිමි දීමනා ඉක්මවා ඔවුන්ගේ වාහන භාවිතය වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් එකතුව රු. 2,037,965 ක් ගෙවීම් කර තිබුණි.

### 3.5 වත්කම් අවභාවිතය

----------------------

ව්‍යාපෘතිය විසින් 2014 ජුනි මාසයේදී රු. 1,534,999 ක වියදමින් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව නමින් පොත් 5,000 ක් මුද්‍රණය කර තිබුණු නමුත් ඉන් පොත් 4,750 ක් බෙදාහැරීමට කටයුතු නොකර 2015 අප්‍රේල් 30 වන විටත් ව්‍යාපෘති පරිශ්‍රයේ තිබුණි.